# හතළිස් අටේ සිට

## ආනන්ද ගුණතිලක

හොපර්ස් ක්‍රොසිං

ලොකු ඉතිහාසයකි සිංහල රටට අපේ
ආඩම්බර කමට හිත් මල් පොකුරු පිපේ
පර ගැති පාලනෙන් මිදිලා මවපු ඔපේ
වනසා දමන හොරු - අද එක පෙලට හැපේ

හතලිස් අටේ සිට නිදහස සම රනවා
හැත්තෑ වෙනි වරට ඒ දින පසු වෙනවා
නැණවත් වෙමින් අප හැම පෙරටම යනවා
එනමුත් උපන් රට ටික ටික වැල ලෙනවා

බටහිර රටක අප ජීවත් වෙන හින්ද
පිරිසිදු නිදහසක් කවුරුත් අත් වින්ද
මව් බිම වෙනස ගැන මතකය හද බන්ද
දුක් වෙමු සැවොම - ඒ බව හිත යට රන්ද

මඩ විසි කර ගැනීමෙන් කර කර යුද්ද
අපි පිල් බෙදුනෙ ඇයි - වැඩි කර ගෙන සද්ද
හොරු රැල රටම කති - ඒ බව බොරු වක්ද
ඇත්තට අපට විලි ලජ්ජාවක් නැද්ද

රට වැසි දිළිඳු අය නෙක බදු වල ගිල'ලා
සුර සැප විඳින හොරු රැල දෙස බල පල්ලා
නීතිය නවන පිරිවර උගුරෙන් අල්ලා
හැකි විගසකින් එළියට ඇද දම පල්ලා

ඌරෝ කැකුණ ඇට පැන පැන තලන කොට
හබන් කුකුලනට මඟුලකි හතර වට
ඔබ අප මරා ගන්නා බව දකින විට
හොරු රැල උඩ පනිති - හිනැහෙති තරඟ යට

දීලා ඉඟුරු අරගෙන සැර මිරිස් ටිකක්
අපෙ මව් බිමේ නෑ පිරිවර විඳින දුකක්
කැහි ගෑණියත් හොටු ගෑණිත් දෙකම එකක්
චන්දෙන් දිනූ පසුවයි දැන් වචන දෙකක්

කිරි වල සේදුවත් කළු අඟුරෙහි වෙනස
ගොඩ ගනු නොහැක නැවතත් දිස්වෙයි එලෙස
හොර තක්කඩි රෑන පන්නා ගනු පිණිස
දැනුවත් කල යුතුය චන්දය දෙන පිරිස

# ඌලරූ පර්වතය

## ප්‍රේමවංශ දසනායක



සැඳෑ හිරු අවරගිර
උනාහල රතු සලුව
දිනා දෑතට රැගෙන
වසා පොරවා උරය

දෙබෑකොට මිහිතලය
නැගීසිට අහස් කුස
ආදි උරුමය කියන
ඌලරූ පර්වතය

සයුර පිසගෙන හමන
සිහිල් මඳ පවන ගෙන
හිරු කිරණ සතපවන
ජීවමානවූ පව්ව

කාලයේ වැලි කතර
මැකී යන පිටු අතර
නොමැකෙනා සටහනක්
ලියා තබනා පව්ව

කල්පයෙන් කල්පයට
මහමෙරව නොසැලි සිට
දුවා දරු කැළට තම
මඟ කියන ගුරු පව්ව

අහිමි කල අයිතියට
පසු නොබා සටන් කොට
දිනා ගන්නට උනට
දිරිය දෙන මහ පව්ව

පරපුරින් පරපුරට
සිහින වරපට රැගෙන
එක සිතින් පිය නඟන
ආදි වාසී ඔවුන

නිරතුරුව තැලෙන සිත
සකම්පිත ළය හොවා
පැතුම් බිඳ වැටෙන හද
අනුප්‍රාණයෙන් තෙමා

උරුම බිම ධජය ගෙන
ඉදිරි මඟ වෙත යොමා
සියලු දන සිත් සතන
අභිමානයෙන් වෙලා

අහස ඉහලට නැගී
මහත් ප්‍රෞඪත්වයෙන්
ලොව දෙසට නෙත හෙලන
ඌලරූ පර්වතය




# සදාකාලික වේදනාව දෛනික ය

## සඳුන් ප්‍රියංකර විතානගේ

"ඉතින් ඈ කීවා
තෝරාගන්නැයි
දෛනික වේදනාව ද
සදාකාලික වේදනාව ද කියා.."

මිනිත්තුවකට හැටවතාවක්වත්
බැලෙනවා තවමත් ෆෝන් එක
නොයැව්වත් පණිවිඩ
බලනවා ඒ දැ යි පණිවිඩ

මල්වත්ත පාරේ, පිටකොටු වීදි අස්සේ
ඇවිද යනවා තවම මම
වෙනදා වගෙ නොවෙයි, මිනිස් රොතු ඇඟ
හැපෙන
අවුස්සනවා හදෙහි කෝපය

සීඩී කඩවලින් ඇහෙනවා
සිහල දෙමළ ගී කලවමේ
ජෝති*ඇන්ජලින් එක්ක අර ගීය කියනවා
අපි මුණගැහුණු දා ඇසුණු

වාඩිගන්නවා මම
අර අතන බංකුවේ
ඔබේ කණ්ණාඩි නැති කරගත් තැන
තනිව වාඩිගෙන ඉද්දි
දැනෙනවා උණුසුම් හුස්මක පහස
ගැහෙනවා හද සද්දෙට
මායාවක් ම විතරයි

බසයක වාඩිගෙන
යනවා කවුළුවෙන් එපිට බලාගෙන
හදිසියෙ දැනෙනවා එන්චාන්ටර් සුවඳක්
ගැහෙනවා ආයෙම හද සද්දෙට
මායාවක් ම විතරයි
තවත් අය ගානවා ඒ ක්‍රීම් එක

බයික් එකේ යද්දිත්
හරවනවා නොහිතාම
සයිඩ් කණ්ණාඩිය
කිසිවෙකුත් පෙනෙන්නැහැ එහි
මා දිහා බලාගෙන සිනාසෙන

කොට කැරළි කොණ්ඩත්
සිහින් කඩි කඩිසර ගමනත්
හදිසියෙ දකිනවා මගතොට
ආයෙ ආයෙම ගැහෙනවා හද සද්දෙට
මායාවක් ම විතරයි

දැං ඉතිං පොඩි වෙනසක්
දෛනිකයි සදාකාලික වේදනාව

# මළ ගෙදර

## ජයසේන කොඩිතුවක්කු

සුදු කොඩි ගෙනෙයි හැඩරුව මළ ගේ අවට
ගොක් සැරසිල්ල සරසයි දෙවටේ වැටට
එල්ලු බැනර් අතරක් නැති එක දිගට
මළගම අරුත අද ගොස් ඇත විහිළුවට

විකිණෙයි කූට්ටමෙ බූරුව මොනරුන්ට
ඉල්ලයි කෙනෙක් කොලයක් ජය ලබන්නට
අල්ලයි ඔට්ටු පොරකාගෙන එක පෙළට
සමරයි මළ ගෙදර ශෝකය මේ ලෙසට

අහස පොලොව ගැට ලන කල්පනාවෙන්
දෙන්නෙක් අර අදී රැක ගන්නට බල්ලන්
තව කී දෙනෙක් තුෂ්නිම් භූතව බලමින්
දාම් පෙතට විකිණේ දුක මළ ගෙදරින්

රෙඩා දමා ගත්තොත් ජය අත ළඟ ය
කැරම් ලෑල්ලක දෙන්නෙක් සටනකය
තවත අය වටේ සිටගෙන ගොළුවන් ය
හන්දියෙ ක්ලබ් එකට මළගේ සමානය

සහචරයන් සමග පැමිණුනු තවත් අයෙක්
මිදුලේ තැනක රොක් වී ලොකු මන්ත්‍රනයක්
ළඟ එන මැතිවරණයෙදි ඉල්ලා මනාපයක්
මළගේ විකුණගෙන කයි නැත ලැජ්ජාවක්

වෙනදා නුදුටු ලෙස අන්දා තිබුනු නිසා
හඳුනා ගන්න බැහැ කාටත් මළ මිනිසා
පෙට්ටිය සයනයකි හැඩ කළ මල් ගවසා
මරණ සතිය දුක ශෝකය ගනු කෙලෙසා




**සිහිසුන්ව ප්‍රේමයෙන්**
**දොළොස් වසකට පසු**
**ඔබ පැමිණ**
**තට්ටුකර කම්මුලට**
**ඇසෙන නෑහෙන හඬින්**
**දුක්මුසුව පවසයි**
**ඬරත්තරනේ අර මල්**
**පිපී තිබුණා හැමදාම ඬ**
**යනුවෙන්.**

**වර්ණා රසිකා ගුණවර්ධන**

**මේ මහා නිහැඬියාව විඳින්න**
**පාවෙල්‍ උරිස්සේ හිස තියන්න**
**අර තුඟු කඳු මුදුනතින්**
**හිමිදිර නැගෙන හැටි බලන්න...**

**වෙහෙස ඇති කුමුදටත්, සැතපෙන්න**
**පාවෙල්..  තඹුරුපෙති ඇහැරවාලන්න**
**හදවතම බිමට බර කරන්**
**මට හිතයි ළදල්ලේ පිනිබිඳක් වෙන්න..**

**තුෂාරී ප්‍රියංගිකා**